Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### නීති නිලධාරී (විධායක නිලධාරී ගණයේ III ශ්‍රේණියේ) තනතුර සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම - 2021

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ පුරප්පාඩුව පවතින නීති නිලධාරී තනතුර (01) සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරාලන ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *බඳවා ගැනීමේ ක්‍රමය :*
රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් පවත්වනු ලබන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයා නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතරින් තෝරාගෙන පුරප්පාඩුව සඳහා බඳවා ගනු ලැබේ. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ලකුණු ලබාදීමේ පටිපාටියට අනුකූලව යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

02. *අවශ්‍ය සුදුසුකම් :*

(i) *අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් :*
ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම.

(ii) *පළපුරුද්ද :*
ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු අදාළ තනතුරේ වසර තුන (03) කට නොඅඩු සක්‍රීය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම. (සක්‍රීය වෘත්තීය පළපුරුද්ද සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන ලේඛනවල පළපුරුද්ද ලබාගත් කාල සීමාව, දිනය හා නිල මුද්‍රාව පැහැදිලිව සඳහන් කර සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.);

හෝ

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු රාජ්‍ය ආයතනයක නීති ක්ෂේත්‍රයේ පහත දැක්වෙන කාර්යයන්ට අදළව වසර තුන (03) කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

(i) නඩු සම්බන්ධයෙන් නීති කටයුතු හා නීතිපති දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණ කටයුතු කිරීම,
(ii) ගිවිසුම් හා සම්බන්ධ නෛතික කටයුතු,
(iii) අදාළ අණපනත් සම්බන්ධ නෛතික කටයුතු,
(iv) පනත් කෙටුම්පත්, චක්‍රලේඛ, රෙගුලාසි වැනි නීත්‍යානුකූල ලියවිලි සම්පාදන කටයුතු,
(v) විවිධ ව්‍යවස්ථාපිත ආයතනවලින් පවත්වනු ලබන නීති කටයුතු හෝ පරීක්ෂණ කටයුතු.
(මෙම කරුණු ලේකම්, දෙපාර්තමේන්තු ප්‍රධානී විසින් නිකුත් කළ සහතිකයකින් සනාථ කළ යුතුය.)

(iii) සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(iv) *වෙනත් සුදුසුකම් :*
- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
- අයදුම්කරුවන් යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.
- මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන දිනට ඉහත සියලු සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබ වැන්දඹු / වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතු වේ.

(ii) මෙම පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්ය. තනතුරට බඳවාගෙන වසර 03ක් ඇතුළත බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් ආකාරයට පළමු වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

(iii) 2014.01.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හි සඳහන් විධිවිධාන අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛවල විධිවිධාන අනුව මෙම පත්වීම භාර ගත් දින සිට වර්ෂ 05ක් ඉකුත්වීමට පෙර අදාළ පරිදි රාජ්‍ය භාෂා ප්‍රවීනත්වය ලබාගත් බව ඔබ විසින් සනාථ කළ යුතු වේ.

(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

04. *වයස් සීමාව :*
අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුද 21 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

05. *වැටුප් පරිමාණය :*
මෙම තනතුරට රු. 47,615-10x1,335-8x1,630-17x2,170-රු. 110,895/-ක (මාසික) වැටුප් පරිමාණයක් හිමිය. (2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි II උපලේඛනයෙහි සඳහන් පරිදි ඔබට වැටුප් ගෙවනු ලබන අතර ඔබට හිමි වැටුප් ඛණ්ඩය (SL-I-2016) වේ.

06. *තනතුරට අදාළ කාර්යයන් :*

(i) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ/තීන්දුවලට එරෙහිව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය, මානව හිමිකම් කොමිෂන් සභාව, අභියාචනාධිකරණය, ශ්‍රේෂ්ඨාධිකරණය, මහජන පෙත්සම් කාරකසභාව, ඔම්බුඩ්ස්මන් වෙත ඉදිරිපත් වන පැමිණිලි වෙනුවෙන් කොමිෂන් සභාවේ ස්ථාවරය පැහැදිලි කරමින් අදළ පරිදි පෙනී සිටීම/නියෝජනය කිරීම ;

(ii) නීති කෘත්‍යයන්ට අදළ සියලුම වාර්තා සකස් කිරීම හා ලිපිගොනු පවත්වාගෙන යාම ;

(iii) නීති කෘත්‍යයන්ට අදළ කටයුතු නීතිපති දෙපාර්තමේන්තුව සමග සම්බන්ධීකරණය කිරීම ;

(iv) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශණ කොමිෂන් සභාව විසින් කරනු ලබන විමසීම් සම්බන්ධයෙන් අදළ වාර්තා සැකසීම, එම කොමිෂන් සභාව විසින් කරනු ලබන කැඳවීම්වලදී අදළ තොරතුරු සමග පෙනී සිටීම ;

(v) රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් ගරු නීතිපතිතුමා පෙනී නොසිටින නඩුවලදී අදාළ අධිකරණය ඉදිරියේ කොමිෂන් සභාව වෙනුවෙන් පෙනී සිටීම ;

(vi) ආයතන ප්‍රධානියා විසින් පවරනු ලබන වෙනත් රාජකාරි කටයුතු.

07. යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ.

| *අනු. අංකය* | *විෂයය* | *ලකුණු* | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| I | අතිරේක අධ්‍යාපන සුදුසුකම් : | | 12 |
| | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ක්ෂේත්‍රයට අදළව ලබා ගන්නා ලද | | |
| | -දර්ශණ ශූරි උපාධිය (PhD) | 12 | |
| | -දර්ශණපති උපාධිය (MPhill) | 09 | |
| | -පශ්චාත් උපාධිය (Masters) | 07 | |
| | -නීතිවේදී උපාධිය (Basic Digree) | 05 | |
| | රජය පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන ක්ෂේත්‍රයට අදළව ලබා ගන්නා ලද පශ්චාත් උපාධි ඩිප්ලෝමාව හෝ පශ්චාත් නීති ඩිප්ලෝමාව (වසරකට නොඅඩු) (උපරිම පාඨමාලා 02ක් සඳහා) | 02 | |
| | රජය පිළිගත් ආයතනයක් විසින් ලබා දෙන ක්ෂේත්‍රයට අදළව ලබා ගන්නා ලද සහතික පත්‍ර පාඨමාලා (මාස 06ට නොඅඩු) (උපරිම පාඨමාලා 02ක් සඳහා) | 01 | |

<table>
<tr><th>අනු. අංකය</th><th>විෂයය</th><th>ලකුණු</th><th>උපරිම ලකුණු</th></tr>
<tr><td>II</td><td>අතිරේක වෘත්තීය පළපුරුද්ද :<br><table>
<tr><td></td><td>අධිකරණය ඉදිරියේ නඩු ගොනු කිරීම් හා පෙනී සිටීම් සඳහා ලකුණු (එක් නඩුවක් සඳහා)</td></tr>
<tr><td>ශ්‍රේෂ්ඨාධිකරණය</td><td>05</td></tr>
<tr><td>අභියාචනාධිකරණය</td><td>04</td></tr>
<tr><td>මහාධිකරණය</td><td>03</td></tr>
<tr><td>දිසා අධිකරණ</td><td>05</td></tr>
<tr><td>විනිශ්චයාධිකාර</td><td>03</td></tr>
</table></td><td></td><td>50</td></tr>
<tr><td>III</td><td>තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම :<br>රජයේ පිළිගත් ආයතනයක අවුරුදු 01ට නොඅඩු තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා හෝ පැය 1500 සඳහා<br><br>රජයේ පිළිගත් ආයතනයක තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා (මාස 06 හෝ ඊට වැඩි)<br>(උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දේ)</td><td>03<br><br>02</td><td>03</td></tr>
<tr><td>IV</td><td>භාෂා හැකියාව (සිංහල/දෙමළ හා ඉංග්‍රීසි භාෂා නිපුණතාවය) :<br><br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ක්ෂේත්‍රයට අදාළව ඉංග්‍රීසි මාධ්‍යයෙන් ලබා ගන්නා ලද-<br><br>-දර්ශණ ශූරී උපාධිය (PhD)<br>-දර්ශණපති උපාධිය (MPhil)<br>-වෙනත් උපාධියක්<br><br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා (වසර 01ක් හෝ පැය 1500)<br><br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා<br><br>-මාස 06/පැය 720<br>-මාස 03/පැය 360<br><br>(උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දේ.)</td><td>15<br>13<br>12<br><br>10<br><br><br>05<br>03</td><td>15</td></tr>
</table>

| අනු. අංකය | විෂයය | ලකුණු | උපරිම ලකුණු |
|---|---|---|---|
| V | සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලබන කුසලතාවය : | | 20 |
| | වෘත්තීය හා එහි ආචාරධර්ම පිළිබඳ ආකල්ප | 04 | |
| | නීති ක්ෂේත්‍රයේ නූතන ප්‍රවණතා පිළිබඳ දැනුම (මානව හිමිකම් නීතිය, ව්‍යවස්ථා නීතිය, සාක්ෂි නීතිය පිළිබඳ විශේෂ අවධාරණය සහිතව) | 10 | |
| | ව්‍යක්ත බව හා තර්කානුකූලව අදහස් ප්‍රකාශ කිරීමේ හැකියාව | 06 | |
| | මුළු එකතුව | | 100 |

08. *සුදුසුකම් සනාථ කිරීම :*

i. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී සියලුම සහතික පත්වල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය.

ii. 7.II හි සඳහන් වෘත්තීය පළපුරුද්ද සනාථ කිරීම සඳහා නිසි පරිදි සහතික කරන ලද නඩු වාර්තාවල පිටපත් ඉදිරිපත් කළ යුතුය.

09. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :*

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ. :-

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත ;
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය ;
(iii) වලංගු රියදුරු බලපත්‍රය.

10. *අයදුම්පත ඉදිරිපත් කළ යුතු ආකාරය :*

(i) අයදුම්පත් 2021.11.22 වැනි දිනට හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුවේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
අංක 1200/9, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

(ii) ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘති පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට 04 දක්වාත් දෙවැනි පිටුව අංක 05 සිට 08 දක්වාත් තෙවැනි පිටුව අංක 09 සිට 12 දක්වාත් වන ආකාරයෙන් පිළියෙල කර තමාගේ අත් අකුරින්ම සම්පූර්ණ කළ යුතුය. (සුදුසුකම් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන සහතිකවල සහතික කරන ලද ලේඛන අයදුම්පත්‍රය සමග අමුණා ඉදිරිපත් කළ යුතුය.)

(iii) අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ "නීති නිලධාරි තනතුර සඳහා ඉල්ලුම්පත්‍රය" යනුවෙන් සඳහන් කළ යුතුය.

(iv) අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයෙකු/ සාමදාන විනිශ්චයකාරවරයෙකු/ දිවුරුම් කොමසාරිස්වරයෙකු/ නීතිඥවරයෙකු/ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධරයෙකු

හෝ රු. 36,491/-ක හෝ ඊට වැඩි මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු විසින් සහතික කළ යුතුය.

(v) දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් තම අයදුම්පත්, තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

(vi) යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් පමණි.

(vii) මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රතික්ෂේප වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

11. *සාවද්‍ය තොරතුරු සැපයීම :*
ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

12. පුරප්පාඩු පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

13. මෙම නිවේදනයේ සඳහන් නොවන කරුණු සම්බන්ධයෙන් හෝ මෙම බඳවා ගැනීමේ ක්‍රියාමාර්ගය තුළ කිසියම් ගැටලුකාරී තත්ත්වයක් ඇති වුවහොත් ඒ පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණ අවසාන තීරණය වේ.

14. මෙම *ගැසට් නිවේදනයේ* භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

එම්. ඒ. බී. දයා සෙනරත්,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2021 ඔක්තෝබර් මස 22 වැනි දින.
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
අංක 1200/9, රජමල්වත්ත පාර
බත්තරමුල්ල

| |
|---|
| |

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

**ආදර්ශ අයදුම්පත්‍රය**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව
නීති නිලධාරී (විධායක නිලධාරී ගණයේ III ශ්‍රේණියේ) තනතුර සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම - 2021

01. 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)
1.2 අගට යෙදෙන නම මුලින්ද අනෙකුත් නම්වල මුලකුරු පසුවද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :1 :————.
(උදා : GUNAWARDHANA H. M. S. K.)
1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

1.4 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

02. 2.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
2.2 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

03. 3.1 ස්ත්‍රී / පුරුෂ භාවය : පුරුෂ - 0 □

ස්ත්‍රී - 1 (අදාළ අංකය කොටුව තුළ යොදන්න)

3.2 උපන් දිනය : වර්ෂය : □□□□ මාසය : □□ දිනය : □□

3.3 අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස (2021.11.22)

අවුරුදු : □□ මාස : □□ දින : □□

3.4 දුරකතන අංකය : □□□□□□□□□□

3.5 විද්‍යුත් තැපැල් ලිපිනය :————.

04. *අධ්‍යාපන සුදුසුකම්* .- උපාධිය හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම්දීමට අදාළ වූ සහතිකය පිළිබඳ විස්තර. :

i. පිරිනැමූ දිනය :.....................
ii. විශ්ව විද්‍යාලය හෝ ආයතනය :.....................
iii. උපාධියේ හෝ අධ්‍යාපන සහතිකයේ නම :.....................
iv. උපාධිය හෝ අධ්‍යාපන සහතිකය වලංගුවන දිනය :.....................
v. පන්තිය :.....................
vi. උපාධිය හැදෑරූ මාධ්‍යය :.....................

05. *අතිරේක අධ්‍යාපන සුදුසුකම්* :

| *පාඨමාලාව* | *ලබාගත් ආයතනය* | *සුදුසුකම/සහතිකය වලංගුවන දිනය* |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

06. *නීති ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද* :

| | *අධිකරණය ඉදිරියේ නඩු ගොනු කිරීම් හා පෙනී සිටීම් සංඛ්‍යාව* |
|---|---|
| ශ්‍රේෂ්ඨාධිකරණය | |
| අභියාචනාධිකරණය | |
| මහාධිකරණය | |
| දිසා අධිකරණ | |
| විනිශ්චයාධිකාර | |

07. *තොරතුරු තාක්ෂණය සම්බන්ධයෙන් හදාරා ඇති පාඨමාලා :*

i. විශ්ව විද්‍යාලය හෝ ආයතනය .....................
ii. උපාධියේ හෝ පාඨමාලාවේ නම .....................
iii. උපාධිය හෝ පාඨමාලා සහතිකය වලංගුවන දිනය .....................
iv. පාඨමාලා කාලය .....................
v. භාෂා මාධ්‍යය .....................

08. *8.1 භාෂා හැකියාව :*

| | *කථනය* | | | *ලිවීම* | | | *කියවීම* | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | *ඉතා හොඳයි* | *හොඳයි* | *දුර්වලයි* | *ඉතා හොඳයි* | *හොඳයි* | *දුර්වලයි* | *ඉතා හොඳයි* | *හොඳයි* | *දුර්වලයි* |
| | | | | | | | | | |
| සිංහල | | | | | | | | | |
| දෙමළ | | | | | | | | | |
| ඉංග්‍රීසි | | | | | | | | | |

8.2 භාෂා සම්බන්ධයෙන් හදරා ඇති පාඨමාලා විස්තර (උපාධි/ඩිප්ලෝමා/සහතික පත්‍ර පාඨමාලා)

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

09. ඔබ කවරදක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ ඇත් ද? (අදාළ කොටුවේ ✓ ලකුණ යොදන්න. ඔබේ පිළිතුර ඔව් නම් විස්තර සඳහන් කරන්න.)

ඔව් ☐ නැත ☐

..........................................................................................................

..........................................................................................................

10. *අයදුම්කරුගේ සහතිකය :*

(අ) මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටසක් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තවද මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බවද ප්‍රකාශ කරමි.

(ආ) මවිසින් සපයන ලද යම් තොරතුරක් අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව හා පත්වීම ලැබීමෙන් පසු නම් සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බවද මම දනිමි.

(ඇ) තවද, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පැවැත්වීම සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

(ඇ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

__________,
අයදුම්කරුගේ අත්සන.

දිනය :__________.

11. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙම අයදුම්පත්‍ර ඉදිරිපත් කරන ........................ මයා/මිය/මෙනවිය මා පෞද්ගලික වශයෙන් හඳුනන බවද, ඔහු/ඇය මා ඉදිරිපිට ............ දින තම අත්සන තැබූ බවද සහතික කරමි.

__________,
සහතික කරන්නාගේ අත්සන හා
නිල මුද්‍රාව.

දිනය :__________.

12. *දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය :*

මෙම අයදුම්පත ඉදිරිපත් කරන .......................... මයා/මිය/මෙනෙවිය මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ ..................... ලෙස සේවය කරන අතර ඔහුගේ/ඇයගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි. මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකළ හැකිය.

__________,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :__________.

නම :__________.
තනතුර :__________.
ලිපිනය :__________.

(නිල මුද්‍රාවෙන් සනාථ කළ යුතුය.)